# 09. රචනය

## වාක්‍ය රචනය

කුඩා අවදියේ පරිසරයේ ඇති විවිධ ද්‍රව්‍යවලින් විවිධ දේ නිර්මාණය කොට අපි ඉමහත් ආස්වාදයක් ලැබුවෙමු. ළමයෙකු නිදහසේ මෙබඳු කාර්යයන්හි යෙදීමෙන් ඔවුන්ගේ බුද්ධිය ද වින්දන ශක්තිය ද, චාලක හැකියාව ද, නිර්මාණාත්මක ශක්තිය ද වර්ධනය වේ. ළමයා නිර්මාණයට පෙළඹවීම ඔවුන්ගේ සහජ විභව්‍යතා ප්‍රබෝධවත් වීමට ද බලපාන බව මනෝවිද්‍යාඥයන්ගේ මතයයි. මේ නිසා නිර්මාණ ශක්තීන් ප්‍රබෝධවත් කරන වාතාවරණයක් ඇති කිරීම අධ්‍යාපනයේ ද වගකීම වේ. කෙනෙකුගේ පෞරුෂයේ පදනම ගොඩනැගෙන්නේත් රසාස්වාදයට අදාළ බීජ ඇතුළු කිරීම තුළිනි. ඒ මගින් ඔහුගේ නිර්ව්‍යාජ හැඟීම් හා ස්වාධීනත්වය ඉස්මතු වේ.

ගුරු උපදෙස් මත ශිෂ්‍ය කේන්ද්‍රීය නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මෙහෙයවිය යුතු වේ. ප්‍රායෝගික පාඩමක් ලෙස ඔබේ නිර්මාණය සැලසුම් කිරීම වැදගත් ය.

### 1 පියවර

පන්ති කාමරයෙන් බැහැරව පරිසරය නැරඹීමට සිසුන් කැඳවාගෙන යාම.



විහාරයට ගොස් බුද්ධ ප්‍රතිමා වහන්සේ නැරඹීම.

ප්‍රතිමාවෙන් මූර්තිමත් වන දයාව, කරුණාව, වැනි මානුෂික ගුණාංග සාකච්ඡා කිරීම.



බෝධීන් වහන්සේ නැරඹීම.


එහි ඇති වැදගත්කම, බෝපත් සැලෙන රිද්මය, අතුරිකිලි විහිදුන ආකාරය, සිසිලස, පෞරාණිකත්වය සාකච්ඡා කිරීම.



චෛත්‍ය රාජයාණන් වහන්සේ නැරඹීම.

වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් ලෙස ඇගයීම.

චෛත්‍යයේ ආකෘති සාකච්ඡා කිරීම.



අවට ඇති සතුන් නැරඹීම.

ඔවුන්ගේ නම්, සොබාදහමේ සුන්දරත්වය, සාකච්ඡා කිරීම.



මල් පාත්තියක් නැරඹීම.

එහි සෞන්දර්යාත්මක රටාව සාකච්ඡා කිරීම.



දිය පාරක් නැරඹීම.

සෞන්දර්යාත්මක රටාව සාකච්ඡා කිරීම.

මේ ආකාරයට පරිසරයේ ඇති විවිධ දේ පිළිබඳ නිරීක්ෂණයට අවස්ථාව සලසා දෙන්න.

### ක්‍රියාකාරකම 9.1

මෙම නිරීක්ෂණ මුල් කොටගෙන :-

- ★ රචනයක් ගොඩ නගන්න.
- ★ චිත්‍රයක් අඳින්න.
- ★ කථාවක් පවත්වන්න.
- ★ කවි පන්තියක් නිර්මාණය කරන්න.
- ★ සංවාදයකට පිවිසවන්න.
- ★ තමා ලද අත්දැකීම් විස්තර කරන්න.


## 2 පියවර

පරිසරයේ ඇති විවිධ හැඩතල හඳුනාගැනීමට සැලැස්වීම.

ඒ තුළින් වෘත්තය "◯" යන හැඩය සිසුන්ට හඳුන්වාදීම.

ඉන්පසු පරිකල්පනය දියුණු කරමින් වෘත්තය යොදා ගනිමින් විවිධ රූප නිර්මාණයට පෙළඹවීම.

උදා -:



මුහුණ



ඉර



ස්විචය

නිර්මාණය කරන රූපයේ කොතනක හෝ වෘත්තය තිබිය යුතු ය. වෘත්තය ඇතුළතින් හෝ පිටතින් විවිධ හැඩ එක්කරමින් එය රූපයක් බවට පත් කළ හැකි ය.

**ක්‍රියාකාරකම 9.2**

එවැනි වෙනත් රූප පහක් නිර්මාණය කරන්න.

## 3 පියවර

| | |
|---|---|
| රෝස මලේ නටුවේ | කටු |
| වන බඹරෝ ඔහොම | හිටු |
| නටුව නොවේ මල | සිඹිමි |
| මම ළමයෝ පැණි | උරමි |
| | |
| අහසේ තරු වැල් | පිරිලා |
| පොළවේ සුදු මල් | පිපිලා |
| මඟුල් ගෙවල් දෙකක් | වගෙයි |
| මේ දෙපොලම හැඩ | ගැහිලා |
| | |
| ගස වතු | සුදු |
| වී පිරි | සිදු |
| පොහොය | නැතිදු |
| සිල්ගත් | බඳු |
| | |
| රැගත් සුරා පිරූ | විතින් |
| සුරත් තඹුරු පෙති සෙ | නෙතින් |
| පුවත් නොදන බමන | ගතින් |
| නටත් අයෙක් සුරා | මතින් |

ඉහත සඳහන් එක එක කවිය පිළිබඳ විස්තරයක් ලියන්න. ඔබ ඉහත කළ නිර්මාණ පහත සඳහන් නිර්ණායක හා ගැළපේදැයි විමසා බලන්න.

හරවත් බව
අන්තර්ගතය
ශිල්පීය කුසලතා
වාක්‍ය රචනයක් මගින් ද මනිනු ලබන්නේ ඉහත සඳහන් අංගයන්ම ය.

## හරවත්බව

රචනය හරවත්වීම තුළින් බලාපොරොත්තු වන්නේ අදාළ මාතෘකාව මනාව විවරණය කොට මාතෘකාවට ගැළපෙන අදහස් සමුදායක් ගොනුකොට දැක්වීමයි. කරුණු ගොනු කිරීමේ දී එක් එක් කරුණක් සඳහා අලුත් ඡේදයක් යොදා ගැනීම අවශ්‍ය වෙයි. ඡේද වෙන් කිරීමේ දී එක් ඡේදයක දී මතු කළ කරුණක් අනෙක් ඡේදයක දී සාකච්ඡා කිරීම නොකළ යුතු ය. එය රචනයේ දී පුනරුක්ති දෝෂය නමින් හැඳින්වේ.

මේ නිසා ඡේද වෙන් කිරීම, රචනයේ වැදගත් ලක්ෂණයක් වන අතර ඡේද අතර මනා සම්බන්ධතාවක්, ගැළපීමක් තිබීම ද අවශ්‍ය ලක්ෂණයකි. කරුණු සියල්ල මාතෘකාවට ගැළපෙන, කුළුගන්වන සුළු ඒවා විය යුතු ය.

එහෙයින් රචනයක් ලිවීමේ දී හැඟීම් - අදහස් විසිර යා නොදී එක් අරමුණක තබාගෙන ලිවීම රචනයේ සාර්ථකත්වයට බෙහෙවින් හේතු වෙයි.

## අන්තර්ගතය

අන්තර්ගතය අරමුණු හා බැඳී පවතී. එහෙයින් හරවත් කරුණු අන්තර්ගත කොට අදාළ ප්‍රස්තුතය හා ගැළපෙන අයුරින් ලිවීම වැදගත් ය.

## ශිල්පීය කුසලතා

මෙහිදී අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු භාවිතය, උක්ත ආඛ්‍යාත භාවිතය, පද බෙදීම පමණක් නොව අත් අකුරු ද සැලකිල්ලට භාජනය වෙයි. කෙතරම් සාරවත් රචනයක් වුවත් කියවීමට අසීරු අත් අකුරු හෝ නොපැහැදිලි අත් අකුරු රචනය සාර්ථකවීමටත්, හොඳ ලකුණක් ලැබීමටත් බාධක වෙයි. එහෙයින් මෙබඳු ඌනතා වළක්වා ගැනීම රචනයක් ලිවීමේ දී ඔබෙන් බලාපොරොත්තු වෙයි. රචනය ලිවීමට පෙරාතුව රචනයේ සැකිල්ල සටහන් කර ගැනීම අදහස් විසිර යා නොදී සාර්ථක රචනයක් ලිවීමට මං පාදයි.

එහෙයින් ව්‍යුහගත නො වූ රචනයක් ලිවීමේ දී රචනයේ අන්තර්ගත විය යුතු කරුණු පිළිබඳ ව සිතා බැලීම වැදගත් වෙයි.

රචනාව කරුණු අතින් පමණක් නොව භාෂාව පැත්තෙන් ද පෝෂණය විය යුතුය. රචනයේ දී අපේක්ෂා කරන්නේ මාතෘකාව පිළිබඳ ව විශ්ලේෂණාත්මක ව, නිර්මාණාත්මක ව හා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීමයි. රචනය ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

* **විෂය ඥානය :-**

- මාතෘකාවට අදාළ සෑම අංශයක් ගැන ම අවධානය යොමු කිරීම.
- අදාළ විෂය ඥානය රචනය තුළින් ප්‍රකාශ වීම.
- කරුණුවල පවත්නා යෝග්‍යතාව හා ප්‍රමාණාත්මක බව.

* **අදහස් ප්‍රකාශනය :-**

- නිවැරදිව අදහස් ඉදිරිපත් කිරීම.
- තර්කානුකූලබව හා විචක්ෂණ හැකියාව.
- තැනට ගැළපෙන උපමා, ප්‍රස්තාව පිරුළු ආදිය භාවිත කිරීම.

* **ව්‍යුහය :-**

- ඡේද බෙදා කරුණු දැක්වීම.
- ඡේද අතර මනා සම්බන්ධතාව ආරක්ෂා කර ගැනීම.
- කරුණුවල පවත්නා සිත්ගන්නාසුලු බව.

* **ශිල්පීය දක්ෂතා :-**

- නිවැරදි වියරණ භාවිතය.
- නිවැරදි අක්ෂර වින්‍යාසය, පද බෙදීම හා විරාම ලක්ෂණ භාවිතය.
- නිවැරදි වාක්‍ය නිර්මාණය.
- පැහැදිලි අත් අකුරුවලින් ඉදිරිපත් කිරීම.

ඉහත කරුණු උපයෝගී කර ගනිමින් ''වන සම්පත සුරකිමු'' යන මාතෘකාව යටතේ රචනා සැකිල්ලක් ගොඩ නගමු.

## වන සම්පත සුරකිමු

'වන සම්පත' යන්න අර්ථකථනය කිරීම.

වනාන්තරවල ඇති වැදගත්කම පැහැදිලි කිරීම.

- මිනිසා සහ ගස්වැල් අතර ඇති සම්බන්ධතාව
- වනාන්තර පිළිබඳ අපේ මුතුන්මිත්තන්ගේ ආකල්ප.
- ස්වාභාවික විපත්වලින් මිනිසා ආරක්‍ෂා කිරීම.
- ස්වභාවධර්මයේ සෞන්දර්යය ආරක්‍ෂා කර ගැනීම.
- පරිසර දූෂණය වළක්වා ගත හැකි වීම.
- වාතය පිරිසිදු වීම, නිසි කලට වැසි ලැබීම.

වන සම්පත විනාශ වන අයුරු.

- ජනගහනය අධික වීම.
- ජාවාරම්කරුවන්ගේ ක්‍රියා කලාප.
- කාර්මීකරණය ඉහළ යාම.
- ස්වාභාවික උපද්‍රව (නියඟ/ළැව්ගිනි)

වන සම්පත සුරැකීමට ගත යුතු පියවර.

- වනාන්තරවලට හානි නොකිරීම.
- අලුත් වනාන්තර ඇති කිරීම.
- වන සම්පත විනාශ කරන අයට නීති මගින් දඬුවම් පැමිණවීම.
- රුක්රෝපණ කටයුතු පුළුල් කිරීම.
- සන්නිවේදන මාධ්‍යවලින් වන සම්පත අගය කිරීමේ වැඩ සටහන් විකාශය කිරීම.
- අධ්‍යාපනය මගින් ආකල්ප ඇති කිරීම.

## ක්‍රියාකාරකම 9.3

ඉහත සඳහන් කරුණු මැනවින් හඳුනාගෙන පහත සඳහන් මාතෘකාවක් යටතේ රචනා සැකිල්ලක් ගොඩනගන්න.

* ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ
* අවුකන බුදු පිළිමය
* ශ්‍රී ලංකාවේ වතු වගාව
* පරිසර දූෂණය
* සිරිපා කඳු මුදුනේ දී

## ක්‍රියාකාරකම 9.4

ඔබ නිර්මාණය කළ රචනා සැකිල්ල උපයෝගී කර ගනිමින් රචනයක් ගොඩ නගන්න.